# 'සති පූජාව' පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

*චින්තානි, මෙත්තා* [1]

**'සතී'** යන්නෙහි අර්ථය **'යහපත් භාර්යාව'** යනුයි. **'සති පූජාව'** යන්නෙන් හැඳින්වෙන්නේ අතීත භාරතයේ වැන්දඹුවන් ස්වකීය ස්වාමි පුරුෂයන්ගේ මෘත දේහය දවන දරසෑයට පැන දිවි පිදිය යුතු බවට වූ චාරිත්‍රයයි. මෙය වැන්දඹුවන් විසින් සිය කැමැත්තෙන් සිදුකරනු ලබන්නක් ලෙස අර්ථ දැක්විණි. සුප්‍රකට සමාජ විද්‍යාඥයකු වන එමිල් ඩුර්කයිම් (1858-1917) ඉදිරිපත් කළ **'පරහිතකාමී සිය දිවි නසා ගැනීම'** (Altruistic Suicide) යන සමාජ විද්‍යාත්මක සංකල්පය මෙකී සති පූජාව සමග සෘජුවම ගැළපෙයි. ඒ මත පදනම් වෙමින් සති පූජාව පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක නියැලීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වේ. පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් කරුණු ගවේෂණයයි. තමා අයත් පුද්ගල සමූහයේ අපේක්ෂා සාධනය වෙනුවෙන් ජීවිතය කැප කිරීම **'පරහිතකාමී සිය දිවි නසා ගැනීම'** යන්නෙන් ඩුර්කයිම් දැක්වූ අර්ථකථනය සති පූජාව මගින්ද හෙළිදරව් වන ආකාරය කෙරෙහි මෙහිලා අවධානය යොමු කෙරේ. මෙසේ සාමූහික විඥ්ඥාණය (Collective Consciousness) උල්ලංඝනය නොකොට, එය සුරකිනු වස් සිය දිවි කැප කරන ආකාරය සති පූජාව ඇසුරින් හඳුනාගත හැකි බව පැහැදිලිය. විශේෂයෙන්ම වැන්දඹුව ඇගේ පුරුෂයාගේ පවුලට අනවශ්‍ය බරක් ලෙස සැලකීමත්, ඇය ස්වකීය වැන්දඹුවත යම් ආකාරයකින් හෝ කඩකිරීම මියගිය පුරුෂයාගේ ආත්මයේ විමුක්තියට බාධාවක් ලෙස සැලකීමත් මෙබඳු චාරිත්‍රයක් පැනනැගීමට හේතුකාරක වූ අයුරු නිරීක්ෂණය කළ හැකිය. අවසාන වශයෙන් නිගමනය කළ හැකි වන්නේ භාරතීය සති පූජා සංකල්පයෙහි යම් සමාජ විද්‍යාත්මක මුහුණුවරක්ද හඳුනාගත හැකි වන බවයි.

**ප්‍රමුඛ පදඃ** සති පූජාව, සිය දිවි නසාගැනීම, සාමූහික විඥ්ඥාණය, විමුක්තිය, වැන්දඹුව

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*chinthapawithrani@gmail.com*